*[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]*

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

**මතුගම අධ්‍යාපන කලාපය**

# දෙවන වාර ඇගයීම - 2023

| 9 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම .............................................................................................................................................

**සැලකිය යුතුයි.**
- **I කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **I කොටසේ ප්‍රශ්නවල මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක 01 හා 02 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසෙහි අදහසට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුරු තෝරන්න.

01. <u>පණට පණ මෙන්</u> සිටිමින් ඔහු සිය ස්වාමියාගේ අගුණ ම කිවේ ය.
   (i). ඉතා වංක ලෙස (ii). ඉතා හිතවත් ලෙස (iii). යටහත් පහත් ලෙස (iv). ඉතා ගෞරවාන්විතව

02. සිරිමල් <u>වැල්වටාරම්</u> කියන්නෙකු බව ගමේ කවුරුත් දනිති.
   (i). අනවබෝධයෙන් කීම. (ii). අත්‍යවශ්‍ය දේ කීම.
   (iii). අනවශ්‍ය විස්තර කීම. (iv). ඉතා කෙටියෙන් කීම.

03. දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.
   “ඉතා පුදුම දෙයක් සිදුවීම.”
   (i). අත්තික්කා ගහේ මල් පිපුණා වගේ (ii). අටුවෙන් දුමට පැන්නා වගේ
   (iii). අතු කඩා මොර කැවා වගේ (iv). අහසට ඉණිමං බැන්දා වගේ

- අංක 04 - 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.

04. ශ්‍රී ලාංකික නව නර්තන කලාව වඩ වඩාත් දේශීය නර්තන, ගායන, වාදන අංශ තුළින් .............................. කිරීමට එස්. පණිභාරත කලාකරුවා කැප විය.
   (i). ස්වයංපෝෂණය (ii). ප්‍රතිපෝෂණය (iii). ස්මරණය (iv). ප්‍රතිනිර්මාණය

05. සිංහල පුවත්පත් කලාවට කුමාරතුංග මුනිදාසයන්ගෙන් සිදු වූ සේවාව ............................ වේ.
   (i). පරිමිත (ii). අනුස්මරණය (iii). උද්දීපනය (iv). අමරණීය

06. නිවැරදි අක්ෂ වින්‍යාසය සහිත වචන ඇතුළත් පිළිතුර තෝරන්න.
   (i). කැලි කසළ, මධ්‍යකාලීන (ii). ගවේෂනය, ශ්‍රේෂ්ට (iii). ප්‍රබන්ද, විවරනය (iv). පරිමානය, විශ්මය

07. අකාරාදි පිළිවෙලට නම් යෙදී ඇති පිළිතුර තෝරන්න.
   (i). සුභාෂිතය, ලෝකෝපකාරය, තිරුක්කුරල්, ලෝවැඩ සඟරාව
   (ii). අමාවතුර, කව්සිළුමිණ, මහාවංශය, රත්නාවලිය
   (iii). පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, සිදත් සඟරාව, ජාතක පොත
   (iv). ථූපවංශය, ශාසනවංශය, දීපවංශය, දාඨාවංශය

08. මුලින් දී ඇති පදයෙහි විරුද්ධාර්ථය නිවැරදි ව <u>යෙදී නැති</u> පිළිතුර තෝරන්න.
   (i). ශීල - දුශ්ශීල (ii). පුරිස් - කුපුරිස් (iii). අලෝභ - නිර්ලෝභ (iv). ජන - දූර්ජන

09. මුලින් දී ඇති පදයෙහි සමානාර්ථවත් පද ඇතුළත් පිළිතුර තෝරන්න.
(i). සඳ - දිනකර, සිසි, දිවයුරු, දියනෙත (ii). මුහුද - නදිය, හොය, සිඳු, සින්ධු
(iii). ජලය - අනල, මිණිමුතු, අටවි, උදක (iv). ප්‍රසිද්ධ - පුවතර, පසිඳු, පතළ, ප්‍රකට

10. සෑම පදයකම මහාප්‍රාණ අක්ෂයක් යෙදී ඇති වරණය තෝරන්න.
(i). අන්ධ, අඝෝෂ, ලේඛන, ඡන්දය (ii). කසළ, අවශ්‍ය, වයඹ, අභය
(iii). ආරම්භ, අවස්ථාව, ඥානය, විශ්වය (iv). ප්‍රමුඛ, දේශය, භාෂාව, පෝෂණය

11. මුලින් දී ඇති පදයට බහු අර්ථවත් පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(i). වත - ශරීරය, වෘත්තය, මුහුණ, විවෘත (ii). නා - නාගයා, ඇතා, නාගස, නායක
(iii). සඳ - කාලය, චන්ද්‍රයා, සඳහා, උතුම් (iv). මව - අම්මා, මෑණි, මාතා, මාතෘ

12. පහත වාක්‍යයන්හි නාම විශේෂණයක් හා ක්‍රියා විශේෂණයක් <u>යෙදී නැති</u> වාක්‍ය තෝරන්න.
(i). සුරතල් දරුවා සතුටින් සෙල්ලම් කරයි. (ii). දක්ෂ රියදුරා විනීතව රිය පදවයි.
(iii). ගොවියා රටට බත සපයයි. (iv). දක්ෂ සිසුවිය හොඳින් ඉගෙන ගනියි.

13. නිත්‍ය බහුවචන පදයක් ඇතුළත් වාක්‍ය තෝරන්න.
(i). කාන්තාවක් නර්තනයේ යෙදෙයි. (ii). ගායකයෙක් ගීයක් ගයයි.
(iii). ශිෂ්‍යාවක් පන්තිය සරසයි. (iv). සමහරෙක් කාලයෙන් නිසි ප්‍රයෝජන ගනිති.

14. ධීවර භාෂාවේ "ඉයත්තුව" ලෙස හැඳින්වෙන්නේ,
(i). කාලගුණය (ii). වර්ෂාව (iii). මුහුදු රළ (iv). සුබ කාලය

15. යම්කිසි දෙයක ඇති තතු ඉක්මවා දැක්වීම,
(i). වක්‍රෝක්තිය යි. (ii). අතිශයෝක්තිය යි. (iii). ව්‍යාජෝක්තිය යි. (iv). ස්වභාවෝක්තිය යි.

16. නූතන ළමා කවියේ මෙන් ම ගීතයේ ද පුරෝගාමී රචකයා ලෙස සැලකෙන්නේ,
(i). මහගම සේකර මහතා (ii). ඩබ්.ඩී. අමරදේව මහතා
(iii). ආනන්ද රාජකරුණා මහතා (iv). කුමාරතුංග මුනිදාස මහතා

17. "කුඹුක් අත්ත ගහට වැටී - වතුර අත ගගා
දැක්ක ද පැණි කුරුල්ලෙකුට - වතුර ඉහිනවා"
ඉහත පද්‍ය කොටස ඇතුළත් පද්‍ය පන්තියේ රචකයා වන්නේ,
(i). ජී.බී. සේනානායක මහතා (ii). රත්න ශ්‍රී විජේසිංහ මහතා
(iii). සුනිල් ජයවීර මහතා (iv). ඩබ්. ඒ. අබේසිංහ මහතා

- අංක 18 සිට 20 දක්වා ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

18. (i). ඔවුහු රටට සේවය කරන්නේ ය. (ii). ගංගා වේගයෙන් ගලා බසිති.
(iii). ඒ තෙමේ දක්ෂ ලෙස නටන්නී ය. (iv). කාන්තාවක් අනතුරකට භාජනය වූවා ය.

19. (i). තෙරුන් වහන්සේ වෙහෙර වඩියි. (ii). මෑණියෝ ඔවදන් දෙයි.
(iii). තරු පෙළ අහසේ බබළයි. (iv). අලි රංචුව ගම වනසයි.

20. (i). මා විසින් කතාවක් පවත්වන ලද්දේ ය. (ii). රියදුරා විසින් රථය පණ ගන්වන ලදහ.
(iii). පඬිවරු විසින් ශාස්ත්‍රීය ග්‍රන්ථ ලියැවිණි. (iv). සංවිධායකයන් විසින් අප පිළිගනු ලැබීමු.

(මුළු ලකුණු 2×20=40යි.)

## II කොටස

- **පළමුවන සහ දෙවන ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීම <u>අනිවාර්ය වේ</u>.**
- 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් **තුනක්** තෝරාගෙන **<u>ප්‍රශ්න පහකට පමණක්</u>** පිළිතුරු සපයන්න.

01. ඉගෙනුම් අවස්ථාවක් ලෙස ඔබ විසින් පන්ති කාමරයේ දී කරන ලද ඇගයීමට අනුව පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(i). ඇගයීම් ක්‍රියාකාරකම් නිර්මාණය සඳහා ඔබ විසින් සිදු කරන ලද්දේ කුමක් ද? (ලකුණු 02)

(ii). එම ක්‍රියාකාරකමට යොදා ගත් නිර්මාණයෙහි මාතෘකාව නම් කරන්න. (ලකුණු 02)

(iii). ඔබ සිදු කරන ලද ක්‍රියාකාරකම වෙනුවෙන් ගුරුභවතා ලබාදුන් උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)

(iv). ක්‍රියාකාරකම සඳහා ඔබ තොරතුරු සොයාගත් මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03)

(v). මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ඔබ මුහුණදුන් ගැටලු තුනක් ලියන්න. (ලකුණු 03)

(vi). මෙම ඇගයීම් ක්‍රියාකාරකම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 16යි.)

02. පහත සඳහන් කොටස්වලින් එකක් තෝරාගෙන වචන 200ක පමණ රචනයක් ලියන්න.

(i). පාරිසරික මෙන්ම සෞඛ්‍යමය වශයෙන් ද අහිතකර ලෙස බලපාන ප්‍රධාන ප්‍රශ්නයකි නිසි කසළ කළමනාකරණයෙන් තොරව කසළ බැහැර කිරීම. මෙම ප්‍රශ්නයට අප සැම ප්‍රායෝගික විසඳුම් සෙවිය යුතු කාලය එළඹ ඇත. "කසළ කළමනාකරණයේ වැදගත්කම" මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ii). ජංගම දුරකථනය අනිසි ලෙස භාවිතයට සිසු පරපුර නැඹුරුවීමෙන් අධ්‍යාපන කටයුතුවලින් බැහැරවීමත්, නොයෙක් අපචාරවලට නැඹුරුවීමත් දැකිය හැකි අහිතකර ප්‍රතිඵල ය. මේ කරුණු සලකා බලා "ජංගම දුරකථනය හා ළමා පරපුර" යන තේමාව යටතේ රචනයක් ලියන්න.

(iii). වර්තමානයේ ඩෙංගු උවදුර විශාල ජීවිත ප්‍රමාණයක් බිලිගෙන ඇත. පරිසරය පිළිබඳ නොසැලකිලිමත් වීම ඩෙංගු පැතිරීමට ප්‍රධාන හේතුව වේ. "සුන්දර පරිසරයක්, නිරෝගී ජීවිතයක්" යන මාතෘකාව යටතේ රචයක් ලියන්න.

(iv). රථවාහන භාවිතය වැඩිවීම, රිය අනතුරු බහුලවීමට හේතුවකි. සැම තත්පරයකටම රිය අනතුරු නිසා මිය යන ජීවිත ප්‍රමාණය වැඩිවෙමින් පවතී. මරණය මග බලා සිටී. පරිස්සම් වන්න යැයි අනතුරු හැඟවීම අවශ්‍ය ය. "රිය අනතුරු වළකමු, ජීවිත රැකගමු" මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(v). කුඩා කල පටන් අප රැකගත්, හැදූ වැඩූ, ඔවදන් දුන් වැඩිහිටියෝ වියපත් වීමත් සමග අසරණ වෙති. ඔවුන්ගේ එකම පැතුම වන්නේ සිරිත්-විරිත්, ගුණ දහම් හා නැණ-නුවණින් පිරි දරුවන් සමාජය තුළ දැකීමයි. එහෙත් ඇතැම් දරුවෝ ගුණ දහම් හා සිරිත් විරිත් අමතක කරති. "වැඩිහිටියන්ට සලකමු" මාතෘකාව යටතේ රචනයක් ලියන්න. (ලකුණු 14යි.)

03. ඔබ ප්‍රදේශයේ යෞවන ක්‍රීඩා සමාජයට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ සපයා දෙන ලෙස ඉල්ලා "ආපිකෝ" වෙළඳ මධ්‍යස්ථානයේ කළමනාකරු වෙත යවන ලිපිය සකස් කරන්න. ඔබ ක්‍රීඩා සමාජයේ ලේකම් යැයි සිතන්න.

නැතහොත්

ඔබ පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ආරාධනා කරමින් දෙමාපියන් වෙත යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න. (ලකුණු 10යි.)

04. පහත ප්‍රශ්නවලට පෙළපොත ඇසුරින් පිළිතුරු සපයන්න.

(i). "හෙළ බසෙහි නව පෙරළියක් ඇති කරන්නට මොහු මුල පිරුවේ කඩුගන්නාවේ පාඨශාලාවෙහි ප්‍රධානාචාර්ය ධූරය දරන අවධියෙහි ය................"

(අ). ඉහත පාඨයේ මොහු යනුවෙන් හැඳින්වෙන තැනැත්තා කවුද?

(ආ). එතුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් නම් කරන්න.

(ii). "ඉදින් මේ සිටු පුත්‍රයාණෝත් රා සොඬහු නම් අපට මහත් සැපය........."

(අ). මෙහි සඳහන් සිටු පුත්‍රයාගේ නම කුමක් ද?

(ආ). මෙම කතා පුවත උපුටාගත් ග්‍රන්ථය කුමක් ද?

(iii). “ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන
ඔබේ සිරිපා දොවන්නම්
හදේ මැලවෙන කැලෑ මල්ගෙන
ඔබේ සිරිපා පුදන්නම්..........”

(අ). ඉහත ගීත නිර්මාණයේ රචකයා කවුරුන් ද?

(ආ). රචකයාට මෙම නිර්මාණය සඳහා පාදක වූයේ කුමන බුදුරුව ද?

(iv). “.........මට වන්දනා කරන්නට බැරි වූයේ ශ්‍රී පාද පද්මය පමණයි..............”

(අ). මෙසේ ප්‍රකාශ කළේ කවු ද?

(ආ). එම ප්‍රකාශය කළේ කාහට ද?

(v). “ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දී ගෙන ........”

(අ). ඉහත පද්‍ය කොටස උපුටා ගන්නා ලද්දේ ඔබේ පෙළපොතේ කිනම් පාඩමකින් ද?

(ආ). මෙම නිර්මාණයේ රචකයා කවුරුන් ද? (ලකුණු 2×5=10යි.)

05. පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගත් තුන තුලානේ අලියා වැටුණු වැවේ
සුන්දරහාමි එතරම් පොහොසතෙක් නොවේ
තුන් ලාහකට බිම වැඩකර දියෙන් වැවේ
රන්වන් කරල් බර වී දැන් බිම නැවේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් හිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හුවක් පමණ දුර
එනවා දිටිමි මිටි බැඳගෙන වියළි දර

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතෙකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

(i). සුන්දරහාමි ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබාගන්නේ කුමකින් ද?

(ii). වියළි දර ගෙන ඒම සඳහා ඔහු නිවසේ සිට කොපමණ දුරක් ගොස් ඇත් ද?

(iii). තුන් ලාහක් බිම වගා කිරීමට මොහු කුමන ධාන්‍ය වර්ගයක් වගාකර ඇත්දැයි ඔබ සිතන්නේ ද?

(iv). සුන්දරහාමි ආගන්තුක සත්කාරයට කැමති අයෙකු බව පෙන්වන කවිපද දෙක උපුටා දක්වන්න.

(v). මෙහි සඳහන් විශේෂණ පද දෙකක් උපුටා දක්වන්න. (ලකුණු 2×5=10යි.)

06. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මහසේරනැව ඉතාමත් ම දර්ශනීය ජලාශයකි. සතර දිග්භාගයෙන් ම මහ වනයෙන් වට ව ඇති මෙහි ගැවසීම වන සතුන්ට අසීමිත නිදහසකි. උන්ගේ නිදහසට බාධා කිරීමට වැව යටතේ ඉඩම් ලද ජනපදිකයන් සුළු සංඛ්‍යාවකට හැකියාවක් නොමැත. නිරන්තරයෙන් ම ගැවසෙන වල් අලින්ගෙන් ද කුඩා රංචු වශයෙන් දිය බීමට පැමිණෙන අහිංසක මුවන්ගෙන් ද ඉතාමත් පියකරු පක්ෂීන්ගෙන් ද නා නා විධ ජලජ ශාකයන්ගෙන් හා ඒවායේ පිපුණු අනේක වර්ණ මල්වලින් ද අලංකෘත වූ ජලාශය නෙතට රසඳුනකි. කිසියම් වන ජීවියෙකු විසින් හෝ පක්ෂියෙකු විසින් නගන හඬකින් පරිසරයේ නිහඬ බව මඳකට වියැකී යයි. එනමුදු දියෙහි සරනා මසකු විසින් දිය මතුපිටට පැමිණ නැවත දිය යටට කිමිදෙන විට නැගෙන “ජබුක්” හඬ මඳ ඈතකට වුව ඇසෙන තරමට නිහඬ බව පරිසරය වෙළාගෙන ඇත. වැවෙහි සොරොව්ව වෙතින් ඇදී යන දිය පහරින් නැගෙන හඬ දිවා රෑ පුරා පරිසරය රසවත් කරන සුන්දර ගීතයකි.

(i). මෙහි සඳහන් වැව නම් කරන්න.

(ii). ජලාශය අවට ගැවසෙන සිවුපා සත්ත්ව වර්ග දෙකක් නම් කරන්න.

(iii). පරිසරයේ නිසල බව නැති කරන ආකාර දෙකක් ලියන්න.

(iv). පරිසරයට ගී ගයන්නේ කවුරුන් ද?

(v). ඡේදයේ සඳහන් පහත පද සඳහා විරුද්ධාර්ථවත් පද ලියන්න.

(අ). අසීමිත - ................................ (ආ). නිහඬ - ................................ (ලකුණු 2×5=10යි.)

07. හිස්තැනට සුදුස පදය වරහන් තුළින් තෝරන්න.

(i). සිසුවියෝ විභාගයට පෙනී ...................... (සිටියහ / සිටියා ය).

(ii). පියාණෝ දරුවන් ආරක්ෂා ........................... (කරයි / කරති).

(iii). භික්ෂූන් වහන්සේ දහම් ............................ (දෙසන සේක / දෙසයි).

(iv). තරු පෙළ අහස අලංකාර ........................... (කරති / කරයි).

(v). ගංගාවෝ සෙමින් ගලා ............................. (බසිති / බසියි). (ලකුණු 2×5=10යි.)

## මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama සමානර්ථයක් Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

## දෙවන වාර ඇගයීම - 2023

| 9 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පිළිතුරු |
|---|---|---|

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (ii) | 06. | (i) | 11. | (ii) | 16. | (iii) |
| 02. | (iii) | 07. | (ii) | 12. | (iii) | 17. | (ii) |
| 03. | (i) | 08. | (iii) | 13. | (iv) | 18. | (iv) |
| 04. | (ii) | 09. | (iv) | 14. | (i) | 19. | (iii) |
| 05. | (iv) | 10. | (i) | 15. | (ii) | 20. | (i) |

(මුළු ලකුණු 2×20=40යි.)

### II කොටස

01. අසා ඇති ප්‍රශ්න සඳහා නියමිත පරිදි පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු පිරිනමන්න. (මුළු ලකුණු 16යි.)

02. රචනය සඳහා

- සාරවත් භාවය - ලකුණු 05
- සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 06
- ශිල්පීය දක්ෂතා හා ඡේදවලට බෙදා තිබීම. - ලකුණු 03 (ලකුණු 14යි.)

03. ප්‍රායෝගික ලේඛනය සඳහා

- ආකෘතිය - ලකුණු 04
- අන්තර්ගතය - ලකුණු 04
- ශිල්පීය දක්ෂතා - ලකුණු 02 (ලකුණු 10යි.)

04. (i). (අ). කුමාරතුංග මුනිදාස මහතා

(ආ). ශික්ෂා මාර්ගය, කියවන නුවණ, හත්පණ, මඟුල්කෑම, හීන්සැරය ......... ආදී ග්‍රන්ථයක්

(ii). (අ). මහධන සිටුපුත්

(ආ). සද්ධර්මරත්නාවලිය

(iii). (අ). මහගමසේකර කවියා

(ආ). අවුකන බුදුරුව

(iv). (අ). අම්මා

(ආ). තම පුතුන් තිදෙනාට

(v). (අ). දෑසේ නිල් පැහැය

(ආ). දයාසේන ගුණසිංහ කවියා (ලකුණු 2×5=10යි.)

05. (i). වැවෙන්

(ii). හුවක් පමණ දුර

(iii). වී

(iv). ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්

පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

(v). රන්වන්, වියළි (ලකුණු 2×5=10යි.)

06. (i). මහසේරනැව

(ii). වල් අලි, මුවන්

(iii). වනජීවියෙකු විසින් හෝ පක්ෂියෙකු විසින් නගන හඬ

මසකු දියමතුපිටට පැමිණ නැවත දියයටට කිමිදෙන විට නැගෙන 'ජබුක්' හඬ

වැවෙහි සොරොව්ව වෙතින් නැගෙන හඬ

(පිළිතුරු දෙකකට ලකුණු දෙන්න.)

(iv). සොරොව්ව

(v). (අ). අසීමිත - සීමිත (ආ). නිහඬ - හඬ (ලකුණු 2×5=10යි.)

07. (i). සිටියහ.

(ii). කරති.

(iii). දෙසන සේක.

(iv). කරයි.

(v). බසිති. (ලකුණු 2×5=10යි.)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න